ස.සෙ.කො.චක්‍රලේඛ අංක 5/2020(i)

මගේ අංකය : ස.සෙ.කො./5/1/iii වෙළුම,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල,දෙවන මහල,
කුරුණෑගල.
2021.08.09

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩල වල,
ගරු සභාපති / සාමාන්‍යාධිකාරී/ කළමනාකරු,

**<u>සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් හා උසස් කිරීම් ඇගයීම් කමිටු සාමාජිකයින් ලෙස සේවය කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම.</u>**

උක්ත කරුණට අදාලව මෙම කොමිෂන් සභාව මගින් නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 5/2020 හා 2020.12.28 දිනැති චක්‍රලේඛයේ 02 ඡේදය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

02. TSL වැටුප් පරිමාණයේ හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයේ හෝ තනතුරු සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩල වල සාමාජික සංඛ්‍යාව 05 ක් විය යුතු අතර, SL වැටුප් පරිමාණයේ හෝ ඊට පහළ වැටුප් පරිමාණයේ තනතුරු සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලවල සාමාජික සංඛ්‍යාව 03 ක් විය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සඳහා සාමාජිකයින් පත් කිරීමේ දී දැනට වයඹ/ස.සේ.කො./05/2014/උපදෙස් ලිපියේ සඳහන් කර ඇති සාමාජිකයින් හයදෙනා (6) අතරින් පත්කිරීම් කළ යුතුය. ඊට සමුපකාර සේවක කොමිෂන් සභා නිලධාරියෙකු හා සමිති භාර සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී/දෙපාර්තමේන්තු නිලධාරියෙකු ඇතුලත් කිරීම අනිවාර්ය වේ.

03. මෙම චක්‍රලේඛය 2021.07.28 දින සිට ක්‍රියාත්මක වේ.

04. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවය ඇතිව බව ද දැනුම් දෙමි.

කොමිෂන් සභා නියමය පරිදි,

එච්.එම්.පී.කේ. හේරත්,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ)

<u>පිටපත්</u>- :

1. ප්‍රධාන ලේකම් - වයඹ පලාත. - කා. දැ.පි.
2. ලේකම්, සමුපකාර සංවර්ධන, වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවනකටයුතු, සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා. දැ.පි.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ටාර් (වයඹ පළාත) - දැ.ගැ.පි - අ.ක.ස.
4. සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ගැ.පි.- අ.ක.ස.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව. - දැ.ගැ.පි.- අ.ක.ස.